**<u>ජාතික ගමනාගමන කොමිෂන් සභාව</u>**

**<u>අන්තර් පළාත් මගීසේවා අවසරපත්‍රහිමියන් වෙත කෙරෙන දැනුම් දීමයි.</u>**

එලඹෙන 2026 සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් 2026.04.08 දින සිට 2026.04.20 දින දක්වා වූ කාල සීමාව තුල වැඩි මගීන් ප්‍රමාණයක් බස් රථ මගින් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරන බැවින් එම කාල සීමාව තුල ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් මගී සේවා අවසරපත්‍ර ලබාගෙන අන්තර් පළාත් මාර්ගවල මගී ප්‍රවාහනයේ යෙදෙන මගීසේවා අවසරපත්‍ර හිමියන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කල යුතු බව මෙයින් දැනුම් දෙමි.

උක්ත කාල සීමාව තුලදී,

- මගීසේවා අවසරපත්‍රයේ සඳහන් මාර්ගයේ බස් රථය අඛණ්ඩව ධාවනය කරලීම අනිවාර්ය වේ.
- වැඩි මගී ඉල්ලුමක් පවතින මාර්ගවල ධාවන කාලසටහන් අවලංගු කරන අතර මගී අවශ්‍යතාවය මත කාලසටහන් අනුපිළිවෙල අනුව බස් රථ ධාවනය කළ යුතු වේ.
- රියදුරුගේ සේවා කාලය පැය 14 ඉක්මවන සෑම අවස්ථාවකම වෙනත් රියදුරෙකු ආදේශ කළ යුතුය.
- මගීසේවා අවසරපත්‍ර මගින් බලය ලබාදී ඇති මාර්ගයේ බස් රථය, විශේෂ චාරිකාවන්හි යෙදවීම නොකළ යුතු වේ.
- බස් රථය සියළු අවස්ථාවලදී ධාවනයට සුදුසු යාන්ත්‍රික තත්වයෙන් පවත්වාගෙන යායුතු වේ.

සෑම අවස්ථාවකදීම මගීන්ට ගුණාත්මක හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවන් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටින අතර මෙම උත්සව කාල සීමාව තුළ උක්ත කරුණු නොසලකා කටයුතු කරන බලපත්‍රලාභීන්ගේ මගීසේවා අවසරපත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා බව තවදුරටත් දන්වා සිටිමි.

සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව
ක්ෂණික ඇමතුම්-1955